# 18 පැදි මිණි

**අපේ පැරණි කවීහු ජාතක කථා වස්තු කොට ගෙන කාව්‍යකරණයෙහි යෙදුණහ. එම කාව්‍ය ග්‍රන්ථ අතර කාව්‍යශේඛරය, සඳකිඳුරුදාකව හා කුසදාකව ද වැදගත් නිර්මාණයන් ය. මෙහි දැක්වෙන්නේ එම කාව්‍යග්‍රන්ථවලින් උපුටා ගත් පද්‍ය පන්ති තුනකි. මේ පද්‍ය පන්ති හැදෑරීමෙන් ඔබේ රසාස්වාදන ශක්තියත්, භාෂා කුසලතාවත් දියුණු වන අතර අපේ කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ හැඟීමක් ද ඔබට ලබා ගත හැකි ය.**

කාව්‍යශේඛරය ලියනු ලැබ ඇත්තේ කෝට්ටේ යුගයේ විසූ ශ්‍රේෂ්ඨතම කවියකු වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි. සේවිකාවක සොයා යන බමුණකුට එක්තරා දෙවියෙක් පෙනී සිට, මඟ සිටියොත් තෝ නසී ගෙදර ගියොත් අඹු නසී යන්න ප්‍රකාශ කරයි. එහි දී වික්ෂිප්තභාවයට පත් වූ බමුණා බියේ වෙවුලමින් සේනක පඬිතුමා අසලට ගොස් දුක කියද්දී සේනක පඬිතුමා හා බමුණා අතර වූ සංවාදය ඉදිරිපත් කරන්නේ මෙසේ ය.

වතත් මලානික විය වෙවුල සිය ගතින්
සිතත් එකඟ නො ව කඳුළැලි වැහේ නෙතින්
ඉතත් පුරුදු කෙනෙකුන් වෙන් වී ද ? වෙතින්
අතත් තිබූ සැපතෙක් පිරිහිණි ද ? ඉතින්

වතා සොමි සඳෙව් නෙත නිලුපුලන් වන
පතා දිගැසියක නොලදි ද? කැමති වන
සිතා ඉඳින සැපතක් නොලදි ද ? යෙහෙන
විතාළ ඉති ඔහු දුක සැප දිය නඳන

දලලඹ නිලඹ ගැබ නැගි ගුම් අසාලා
ගිම්කල තැවුලි මිලි නිල්ගල ගොසාලා
ඔද වැඩි ලෙසින් සැනහී වක ගසාලා
කී මෙලෙසින් දද මුව අත වසාලා

කුසජාතක කතාවේ දැක්වෙන පරිදි පබාවතී කුමරිය කුසරජු හැර දා තම පිය රජුගේ රාජ්‍යයට යයි. එයින් කුස රජතුමා ශෝකයට පත් වී සිටින අයුරු අලගියවන්න මුකවෙටි පඬිතුමා කුස ජාතක කාව්‍යයෙහි මෙසේ නිරූපණය කරයි.



නුබපත සඳ යුගත රිවි ලෙස දිස් වීය
යහනත අතුළ මල්පෙති කටු ලෙස් වීය
පියකත දෙන රඟුම් ගී නොම තොස් වීය
පබවත නැති මෙරජ විමනත හිස් වීය

සිහිල් සොම් තරිඳු රිවි මෙන් දිසේයා
කොවුල් නද ඇසෙයි යකු හඬ ලෙසේයා
ලකල් පබාවති සහ නොම වැසේයා
මෙකල් මෙමා සිතු නළවම් කෙසේයා

සුරඹා ලෙසින් නන් වෙස් ගනිමින් නොමින
නළඹා වුත් රඟුම් පෙන්නා වෙනින් වෙන
පොලඹා ගත නොහී මහ බෝසතුන් මන
කරබා සිටිති බිතු ඇඳි සිතියම් ලෙසින

සඳකිඳුරු ජාතක කතාවේ එන පරිදි බෝසත්තුමා කිඳුරකුව ඉපිද කිඳුරියක හා කෙළිදෙළෙන් පසුවෙයි. දඩයමේ ගිය රජු කිඳුරිය පිළිබඳ සිත් ඇති ව කිඳුරා මරා දමයි. ඉන් කම්පාවට පත් කිඳුරිය දුක්වන ආකාරය විල්ගම්මුල හිමියන් සඳකිඳුරු දා කවෙහි ඉදිරිපත් කරන්නේ මෙසේ ය.



රනේ රස මෙනේ දවසැර පෙර දවසේ
සෙනේ වඩමිනේ පැසී රස පහසේ
වෙනේ නොමඳිනේ දුක්වූ කල මෙලෙසේ
අනේ දෙවියනේ සැනසෙමි දූන් කෙලෙසේ

සුරඟන සදිසි වරඟන ඇතිව තමපුර
අපගෙන සමඟ වැසැ සැප විඳිමියි නිතර
සිතමින මහිමි විදූ මැරුවා දැක මෙවර
බිය ගෙන ගියේ දෝ දෙවියෝ මෙවන හැර

වහසින් නෙත් කඳුළු හැලි නොනවතින්නේ
මෙලෙසින් විඳින දුක් හැරියොත් මෙතැන්නේ
අහසින් යනෙන නන් සිදු විදු දරන්නේ
වෙසෙසින් මහිම ඇති බව මින් දැනෙන්නේ

### අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| දලලඹ | - | වැහි වලාකුළ |
| දියනඳන | - | බෝසතුන් |
| නළඹා | - | නාටිකාංගනාවෝ |
| නිල්ගල | - | මොනරා |
| නිලඹ | - | නිල් අහස |
| රස පහසේ | - | රස ස්පර්ශයෙන් |
| සිදු විදුදරන් | - | සිද්ධ විද්‍යාධරයන් |

## ක්‍රියාකාරකම 01

i. සේනක පඬිතුමා බමුණාගෙන් විමසූ ප්‍රශ්න තුනක් ලියන්න.

ii. සතුටට පත් වූ බමුණාගේ ස්වරූපය කවියා දක්වා ඇත්තේ කෙසේ ද?

iii. කුසරජු තම වියෝ දුක ප්‍රකාශ කිරීම සඳහා යොදාගෙන ඇත්තේ කවර සිදුවීම් ද?

iv. කුසරජුගේ දැඩි ශෝකය ප්‍රකාශ කිරීම සඳහා මෙහි දක්වා ඇති යෙදුම් දෙකක් ලියන්න.

v. කිඳුරා සහ කිඳුරිය දැඩි ස්නේහයෙන් පසු වූ බව දැක්වීමට යොදාගෙන ඇති කවි පදය කුමක් ද?

vi. දෙවියන් පවා වනය අතහැර යාමට හේතුව වශයෙන් කිඳුරිය දක්වන සාධකය පෙන්වන්න.

## ක්‍රියාකාරකම 02

මේ යෙදුම් පැහැදිලි කරන්න.

i. වතා සොමි සඳෙවි
ගිම්කල තැවුලි නිල්ගල
යුගත රිවි
සොමි තරිඳු රිවිමෙන්
කරබා සිටිති
සුරඟන සදිසි වරඟන
රනේ රස මෙනේ

ii. අතමිට, අතදීම, යන එන අතක්, අතපානවා, අතට පයට, යන වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍යය බැගින් ලියන්න.

## ක්‍රියාකාරකම 03

i. කිඳුරියගේ විලාපය ඇතුළත් කවිපෙළ ගායනා කරන්න.

ii. කිඳුරිය වැළපෙන ආකාරය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

**iii. මේ කියමන්වල යටි අරුත් විමසන්න.**

නුබපත සඳ යුගත රිවි ලෙස දිස්වීය
කොවුල් නද ඇසෙයි යකු හඬ ලෙසේයා

iv. මේ කියමන්වල යටි අරුත් විමසන්න.

සොමි තරිඳු රිවිමෙන්
මල් පෙති කටු වගේ

ii. මෙහි උපමා උපමේයයන් වෙන් කරන්න.

යකුහඬ මෙන් කොවුල් නද
නෙත් නිලුපුල් වගේ
බිතු සිතුවම් මෙන් නළඟා

## පැවරුම්

01. මේ කවි පොත්වල කර්තෘවරුන්ගේ වෙනත් නිර්මාණ සඳහන් කරන්න.

02. කුස ජාතකය ඇසුරින් කුස ජාතක කාව්‍යය බිහි වී ඇත. එවැනි නිර්මාණ වගුගත කරන්න.

| ජාතක කතාව | නිර්මාණය | කතුවරයා |
| --- | --- | --- |
| | | |

03. ජාතක කතාවලින් පෝෂණය ලැබූ අපේ සාහිත්‍යය යන මැයෙන් දේශනයක් සූදානම් කරන්න.

04. කුසජාතකය, සඳකිඳුරු දා කව කියවා රස විඳින්න.